**අගලවත්ත ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රිකය**
**--------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 26 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු.1,318,864 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ii) | ලැබීම් සාරාංශයට අනුව වර්ෂයේ තැන්පත් ලැබීම් රු.2,176,996 ක් වුවත්, රු.2,106,024 ක් ලෙස ගිණුම් වලට ගෙන තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (iii) | හඳුනාගැනීමකින් තොරව රු.21,076,302 ක මුදලක් මෝටර් රථ හා කරත්ත ගිණුමෙන්ද ප්‍රාග්ධනයට ආදාමින් දායක වීමේ ගිණුමෙන්ද කපා හැර තිබුණි. | හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කළ යුතු වේ. | ශේෂය තහවුරු කර ගැනීමට තොරතුරු නොමැත. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හෙළිදරවු වූ සභාවට අයත් ට්‍රැක්ටර් 02 ක් හා ස්කිප් ලෝඩරයක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | ජර්නල් සටහන් මගින් නිවැරදිව ගිණුම්ගත කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | රු.1,916,000 ක් වූ යන්ත්‍රෝපකරණ රු.19,160,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කල යුතුවේ. | ජර්නල් සටහන් මගින් නිවැරදිව ගිණුම්ගත කරමි. |
| (vi) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ඉඩම් 05 ක් හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති ඉඩම් 02 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් තක්සේරු කර ගිණුම්ගත කල යුතුවේ. | 2019 වර්ෂයේදී ඉඩම් තක්සේරු කර ගිණුම් ගත කිරිමට කටයුතු කරමි. |
| (vii) | රු.347,000 ක් පිරිවැය වූ ට්‍රැක්ටරය මෝටර්රථ හා කරත්ත හා යන්ත්‍රෝපකරණ යන ගිණුම් දෙකෙහිම සටහන් කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරමි. |
| (ආ) | නොසැසදීම්<br>--------------<br>වත්කම් ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන් හා ස්ථාවර වත්කම් ලේඛන අතර රු.5,538,022 ක වෙනසක් විය. | වෙනස හදුනාගෙන ගැලපීම් කල යුතු වේ. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරමි. |
| (ඇ) | අවිනිශ්චිත ගිණුම්<br>--------------------<br>රු.159,479 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය හදුනාගෙන අවශ්‍ය ගැලපීම් කර නිවැරදි කිරීමක් කර නොතිබුණි. | වෙනස හදුනාගෙන නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | රු.159,479 ක් වූ අවිනිශ්චිත ශේෂයෙන් රු.112,304 ක් හදුනාගත් අතර එය ජර්නල් සටහන් මගින් නිවැරදිව ගිණුම්ගත කරමි. |
| (ඇ) | ලිඛිත සාක්ෂි නොමැතිවීම<br>--------------------------------<br>භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා විස්තරාත්මක උප ලේඛන නොමැතිවීම නිසා එකතුව රු.33,132,518 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී අදාල සාක්ෂි ඉදිරිපත් කරමි. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කිතුල්ගොඩ නාහේන කන්ද මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේ සිට ලැබිය යුතු රු.56,347 ක ශේෂයක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.56,347 ක අතරුඳවුම් පළාත් පාලන අමාත්‍යාංශයෙන් ගෙන්වා ගෙන ගෙවීම් කිරිමට කටයුතු කල යුතු වේ. | රු.56,347 ක අතරුඳවුම් මුදල පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. |
| (ii) | 2013 සිට 2016 දක්වා කාලයට අදාල රු.881,491 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පැරණි කර්මාන්ත ණයහිමි ශේෂ නිරවුල් කල යුතු වේ. | 2013 වර්ෂයේ සිට පවතින කර්මාන්ත ණයහිමි ශේෂ නිරවුල් කිරිමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | - | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ යම් නිශ්චල දේපලවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුවේ. | හඳුනාගැනීමේ කටයුතු සිදු කරමින් පවති. |
| (ආ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන | | පරිසර බලපත්‍ර 04 ක් අළුත් කිරිමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර අළුත් කල යුතුවේ. | ආයතනවලට බලපත්‍ර ලබා ගැනීමට දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගැසට් නිවේදනය 2017 දෙසැම්බර් 08 දිනැති අංක 2049 දරන ගැසට් පත්‍රය 22,100 | දැන්වීම් පුවරු 14 කින් අයවිය යුතු ගාස්තු අයකර නොතිබුණි. | ගාස්තු අයකල යුතුවේ. | මුදල් නොගෙවූ දැන්වීම් පුවරු ගලවා ඉවත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,635,243 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,343,281 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,232,085 | 4,050,186 | 3,012,862 | 1,037,324 | 2,638,297 | 4,426,003 | 3,507,871 | 918,132 |
| (ii) | කුලී | 8,647,000 | 3,763,782 | 3,326,869 | 436,912 | 8,440,000 | 3,509,818 | 3,397,206 | 112,612 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 352,500 | 313,300 | 313,300 | - | 285,000 | 299,425 | 299,425 | - |
| (iv) | වෙනත් ආදායම් | 10,549,000 | 17,751,005 | 11,331,388 | 14,719,617 | 10,327,000 | 19,695,021 | 9,275,404 | 10,419,617 |

#### 2.2.2 ආදායම් රැස් කිරිමේ කාර්යය සාධනය

(අ) වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හිඟය රු.840,797 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.405,993 ක් හෙවත් සියයට 48 ක් පමණක් අයකර තිබුණි. වර්ෂය අවසානයට වරිපනම් | ඉතිරිය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනිමට ක්‍රමවේදයක් අනුගමනය කර ඇත. |

| | | |
|---|---|---|
| හිඟය රු.1,009,253 ක් වු අතර එම හිඟයෙන් 2019 මැයි 31 දින වන විට රු.836,898 ක් හෙවත් සියයට 83 ක් අය කර ගෙන නොතිබුණි. | | |
| (ii) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදු ශේෂය තුළ වර්ෂ 01-03 දක්වා හිඟය රු.557,140 ක්, වර්ෂ 03-05 අතර හිඟ රු.136,183 ක් හා වර්ෂ 05 ට වඩා වැඩි හිඟය රු.151,081 ක් විය. | දීර්ඝ කාලීනව පවතින හිඟ ශේෂ අයකර ගැනිමට කටයුතු කල යුතු වේ. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනිමට ක්‍රමවේදයක් අනුගමනය කර ඇත. |

(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,719,617 ක් හා මුද්දර ගාස්තු රු.12,000,000 ක් විය. | ආදායම් අයකර ගත යුතු වේ. | උසාවි දඩ අයකර ගැනීම සඳහා උපලේඛන සකස් කර භාර දී ඇත. |

3 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්යය සාධනය
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථා<br>------------------<br>ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 05 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | මේ දක්වා පනවාගෙන ඇති අතුරු ව්‍යවස්ථා දක්වා ඇති අතර තව දුරටත් වාහන සේවා කරණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරිමේ ව්‍යාපෘතිය හා කොන්ක්‍රීට් බ්ලොක් ගල් ව්‍යාපෘතිය සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරිමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පින්නගොඩ, නාවිටිගල මාර්ගය සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතියේ කොන්ක්‍රීට් සණකම අඩුවීම සම්බන්ධයෙන් වූ පාඩුව නිවැරදිව තක්සේරු නොකර අතරුදවුම් මුදලින් රු.42,660 ක් අයකර ගෙන තිබුණ ද, ව්‍යාපෘතිය නිසි ප්‍රමිතියකට සිදු වී නොමැති බැවින් මාර්ගයේ පැවැත්ම පිළිබඳ ගැටලුකාරි තත්වයක් දක්නට ලැබුණි. | පාඩුව තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | කොන්ත්‍රාත් දුන් සංවිධානය අසාදු ලේඛනගත කර ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

---

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කාර්ය මණ්ඩල තොරතුරු අනුව ද්විතියික මට්ටමේ හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 01ක බැගින් විය. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. |
| (ආ) | වාහන 25 ක් ක්‍රියා කරවීම පිණිස සභාව සතුව සිටිනුයේ රියදුරන් 09 දෙනෙකු හා යන්ත්‍ර ක්‍රියාකරුවන් 03 දෙනෙකු පමණි. | පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම හා තනතුරු අනුමත කරවා ගැනීම් කලයුතු වේ. | රියදුරු තනතුරු 05 ක් සඳහා නව බඳවා ගැනීම් සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත. |

3.4 වත්කම් කළමණාකරණය

---

3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ ගංවතුරින් හානි වූ මාර්ග 07 ක් පිලිසකර කිරීමට කටයුතු කර නොතිබුණි. | ගංවතුරින් හානි වූ මාර්ග කඩිනමින් පිලිසකර කලයුතු වේ. | මෙම මාර්ග සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර ඒවා ලැබීමෙන් පසු පිලිසකර කිරිම් සිදු කරමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

--------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| 2012 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.1.1(ඉ) ,2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.1.1 (ඇ) හා (උ) නිවැරදි කර නොතිබුණි. | නිවැරදි කිරීම් කල යුතුවේ. | තොරතුරු තහවුරු කර ගත නොහැකි බැවින් නිවැරදි කල නොහැකි විය. |